RECEIVED
08 JUN 2009

# හේතුඵලතා සුසමාදර්ශ පිළිබඳ

# දාර්ශනික විග්‍රහයක්

# CAUSAL PARADIGMS

## A Philosophical Analysis

ශ්‍රී ලංකා, කැළණිය විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරන
ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධනය
2008

FGS/03/01/07/2004/01
එච්.ආර්.එන්.පී.කේ හඳගම

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 504 |
| වර්ග අංකය | |

# සාරාංශය

## හේතුඵලතාව හා සුසමාදර්ශයන් පිළිබඳ දාර්ශනික විග්‍රහයක්

හේතුඵල සංකල්පයේ විධිමත් ගෙනහැරපෑමක් අපරදිග විද්වත් චින්තාවන් අතර පළමුවරට ජනිත වනුයේ ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්ගේ සංකල්පනාවේය. ඔහුගේ මෙම දාර්ශනික අදහස මෙසේ එළිදරවු කෙරේ; යම් කිසි වස්තුවක්, දෙයක්, ප්‍රපංචයක් දෙස දාර්ශනිකයා බලයි. දෙවනුව තවදුරටත් වඩාත් උනන්දුවෙන් ඒ දෙස බලයි. අවසාන වශයෙන් තමා ලද අනුභූතීන්වලින් මෑත් වී එසේ තමා ලද අනුභූතීන්වලට හේතුන් ගැන සිතුවිලි හසුරුවයි. ඇරිස්ටෝටල්ගේ මෙම විග්‍රහයත් සමග බටහිර දර්ශන විෂයයේ හේතුඵලතාව පිළිබදව කතිකාවන් ගොඩනැගේ. ඔහු පෙන්වාදෙන පරිදි නිර්වචන හරහා ගොඩනැගෙන අධ්‍යයනයන් කොපමණ පැවැතේද ඒ ප්‍රමාණයටම විෂයයන් ද පැවැතේ. එබඳු විෂයයන් අතර භෞතික විද්‍යාව, ආචාරවාදය, දේශපාලන විද්‍යාව හා සෞන්දර්ය විද්‍යාව යන්න සමහරක් වෙති. ඇරිස්ටෝටල්ගේ විවරණයෙහි ප්‍රධාන තැන ගනු ලබනුයේ හේතුඵලතාව පිළිබඳ සංකල්පය හෙයින් දර්ශන විෂයයේ කාර්යය වනුයේ එහි ස්වරූපය එළිදරවු කෙරෙන විමර්ශනයකි. එයට ප්‍රථම හේතුව හෙවත් අචල චාලකයා ද අන්තර්ගතය. මේ සංකල්පය එළිදරව්වේදී එය ගන්නා පළමු සුසමාදර්ශය එසේය. මෙහි රැඳී පැවතෙන අනෙක් සංකල්පය වන්නේ හේතුඵල සම්බන්ධය යන්න වේ.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය,

තෝමස් ඇක්වෙනාස්ගේ දාර්ශනික සංකල්පනාවේ අන්තර්ගත වන හේතුඵල සංකල්පයක් ද වේ. හේතුඵලතාව විවරණය කෙරෙන මෙම විග්‍රහයේ දෙවෙනි සුසමාදර්ශය මෙතැන දිස් වේ. මෙහි එන ප්‍රධාන කාරණාව වන්නේ, හේතුඵල සංකල්පය මුල් කොටගෙන දෙවියන්ගේ පැවැත්ම සනාථ කර දැක්වීමය. ලෝකයේ විවිධ දෑ චංචල බවක් හෝ

හටගැන්මක් පෙන්වන බව සඳහන් කරන ඇක්වෙනාස් පහත පෙනෙන ස්වරූපයේ ප්‍රශ්න නම් හේතුඵලතාව හා සම්බන්ධ යයි පවසයි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

i. භෞතික වස්තූන්හි චංචල බව ඇති වනුයේ කුමක් හේතුකොටගෙනද?

ii. යහපත් රාජ්‍යය ඇති කරනුයේ කුමක් හේතුකොටගෙනද?

ඔහු පෙන්වා දෙන පරිදි මේ ප්‍රශ්නවල අන්තර්ගතය සකසනුයේ හේතුඵලතාව පිළිබඳ සංකල්පනාවයි. දාර්ශනික වශයෙන් ගන්නා විට මෙතැන සනිටුහන් කරනුයේ මීට පෙර දක්නා ලද සුසමාදර්ශයන් නොව වෙනත් සුසමාදර්ශයකි. හේතුඵලතාව ගැන එන මේ වචන හරඹයේදී හේතූන් හා ඵලයන් භාවිත වුවද හේතුඵල සම්බන්ධයේ ස්වරූපය ගැන නිහඬ බවක් පෙන්වයි.

බටහිර දර්ශන විෂයයේ විෂය පථය බෙහෙවින් වෙනස් වන්නා වූ මොහොත සහ නවතම සුසමාදර්ශයන් ගැන එන වචන හරඹයක් මීළඟට සනිටුහන් කරමි. එනම් ඩේවිඩ් හ්‍යූම් නමැති බ්‍රිතාන්‍ය අනුභූතිවාදී දාර්ශනිකයා විසින් හේතුඵලතාව පිළිබඳව ගෙන හැර දක්වන දාර්ශනික විමර්ශනය වේ. ඔහුට අනුව හේතුඵලතාව එළිදරවු කරනවිට හේතුඵල ගැටලුවක් ජනිත වේ. එය පහදා දීමේ ව්‍යායාමයේදී ඩේවිඩ් හ්‍යූම් කරනුයේ විවරණයකට (exposition) වඩා විග්‍රහයකි (analysis). ඔහුගේ ප්‍රශ්නය, පළමු කොට මෙසේය. හේතුඵලතාව පිළිබඳ සංකල්පයේ ආරම්භය කවරේද? යන්නයි. මේ ප්‍රශ්නයට ඔහු දෙන පිළිතුර සකස් වනුයේ පූර්ණ සංකල්ප සහ උපස්ථිති නමැති වචන හරහායි. පූර්ණ සංකල්ප සැකසෙනුයේ උපස්ථිති පාදක කොට ගෙන හෙයින් හේතුඵලතාව යන්න ද උපස්ථිතිවලින් සැකසෙන සංකල්පයක්ද? යන්නයි. ඩේවිඩ් හ්‍යූම් විසින් මෙසේ සංකල්ප හා උපස්ථිති පාදක කරගෙන කෙරෙන විග්‍රහයේ අවසානය වනුයේ හේතුඵලතාව යන්න පූර්ණ සංකල්පයක් නොව හිස් සංකල්පයක් බව පෙන්වීමය. හේතුඵලතාව යන්න විසින් කිසියම් ආකාරයකට ඔප් නංවන

සම්බන්ධය වන්නේ හේතුඵල සම්බන්ධය වේ. බාහිර ලෝකයේ සිදුවීම් මාලාව විසින් මේ සම්බන්ධය බිහි නොකරයි. නිතර නිතර දැකීම ඇසීම හා විඳීම නිසා හේතුව සහ ඵලය නැමති සිදුවීම් දෙක අතරට සම්බන්ධය ආරෝපණය කරනුයේ මිනිසාගේ පුරුද්දක් විසිනි. ඒ නිසාම එතැන තර්කනයක් නැත. එම විග්‍රහයේ අවසානය වනුයේ හේතුව සහ ඵලය පූර්ණ සංකල්පයක් වුව ද සම්බන්ධය යන්න හිස් සංකල්පයක් බව අවබෝධ කරවීමයි. ඒ අනුව හේතුඵල සම්බන්ධය අවශ්‍ය එකක් නොවෙයි. එම සංකල්පනාවට නව මුහුණුවරක් දීම පමණක් එහිදී සිදුව ඇත.

හ්‍යුම්ගේ මෙම විග්‍රහය එමැනුවෙල් කාන්ට් විසින් ප්‍රතික්ෂේප කරන අතර හේතුඵල සංකල්පයට කිසියම් අවශ්‍ය ස්වරූපයක් දීමට උත්සාහ ගෙන ඇත. එය නවතම ආකාරයකි. මේ බුද්ධිමය අවශ්‍යතාව නූතන දර්ශනයේ ජෝර්ජ් හෙගල් සහ සමකාලීන විශ්ලේෂි දර්ශනයේදී නැවත ප්‍රතික්ෂේප වී ඇත. මීට පෙර භාවිත කළ ආකාරයට වඩා කිසියම් සුවිශේෂ පදනමකින් මෙම සංකල්පය පැහැදිලි කිරීමට විශ්ලේෂි දාර්ශනිකයෝ සමත් වී ඇත. එනම් නවතම ආකාරයේ දාර්ශනික ශිල්පීය ක්‍රම ඉදිරිපත් කරමින්, භාවිත කරමින්, හේතුඵල සංකල්පයට නව පණක් දෙනු ලැබුවේ ගිල්බට් රයිල් සහ විට්ගන්ස්ටෛන් නමැති විශ්ලේෂි දාර්ශනිකයින්ය. එම පදනම වඩ වඩාත් පැහැදිලි වූයේ මේ සංකල්පය ගන්නා විවිධ වචන හරඹ, ඒ ඒ තාර්කික පද්ධති හරහා ගොඩ නැගෙන ආකාරය පැහැදිලිව ඉදිරිපත් කිරීමෙනි.

හේතුඵලතාව පිළිබඳව මෙතෙක් ගොඩනැගුණා වූ විග්‍රහයන්ට වඩා තරමක් වෙනස් ආකාරයේ විග්‍රහයක් නූතන විද්‍යාත්මක විමර්ශනයන් ඇසුරෙන් හමුවේ. එනම් හේතුව, ඵලය සහ අවශ්‍ය සම්බන්ධය නැමති වචන හරහා විද්‍යාත්මක වචන හරඹය පැහැදිලි වේ. එම වචන නම් සිදුවීම් ප්‍රධාන කොට අර්ථවත් වේ. මෙම කාර්යයේදී විද්‍යාත්මක වචන හරඹය යන්නෙන් අදහස් කරනුයේ නිව්ටෝනියානු භෞතික විද්‍යාව සම්බන්ධ වන සංකල්පනාවය. සමස්ත විශ්වීය ක්‍රියාවලිය රඳා පවත්නේ යුක්ලීඩියානු ජ්‍යාමිතිය පදනම්ව බව

නිව්ටෝනියානු චින්තනයේ මූලික පිළිගැනීමකි. මෙම මතය කිසියම් වෙනසකට ලක්වූයේ දහ නවවන සියවස මුල භාගයේ පමණය. එනම් ඇල්බට් අයින්ස්ටෛන් (ක්‍රි:ව: 1879-1955) විසින් හඳුන්වා දුන් සාපේක්ෂතාවාදයෙන් පසුවය. එනම් කාලයෙහි හා අවකාශයෙහි සාපේක්ෂක බව මෙන්ම නිව්ටෝනියානු විද්‍යාවේ යාන්ත්‍රික පදනම භෞතික විද්‍යාවට නොයෙදෙන බවද සාපේක්ෂතාවාදයට මුල්වන අදහස් අතර වේ. විශ්වයේ, අවකාශයේ, ජ්‍යාමිතිය භෞතික ජ්‍යාමිතියක් වශයෙන් යුක්ලිඩියානු ජ්‍යාමිතියෙන් වෙනස්වන බව ද ඒ මතයට පදනම් වෙයි.

මේ අනුව නිව්ටෝනියානු චින්තනයේ ජ්‍යාමිතික ව්‍යුහය පිළිබඳ සංකල්පයේ එන බරපතල වැරදි බවත්, අයන්ස්ටෛනියානු සංකල්පයේ එන නිවැරදි බව හා නව්‍ය බවත්, පසුවආ විද්‍යාඥයෝ පිළිගත්හ. මොවුන් අතරින් වඩාත් වැදගත් වනුයේ බර්කොෆ් (Birkhoff), වොන් නියුමාන් (Von Newmann), මැක්ස් ප්ලෑන්ක් (Max Planck) යන අයයි. ඔවුහු යුක්ලිඩියානු ජ්‍යාමිතිය හා සම්බන්ධ සැකිල්ල මුල්කරගෙන පැවති සංකල්පනාව දැඩි සේ විවේචනය කර ඇත. මේ නිසාම යුක්ලිඩියානු ජ්‍යාමිතියේ ප්‍රධාන අදහස් මුල් කරගෙන ගොඩ නැගුණු නිව්ටෝනියානු විද්‍යාත්මක ආකල්පයට දැඩි හානි සිදු විය. එසේ මතවාදයට ලක්ව ප්‍රතික්ෂේප වූ නිව්ටෝනියානු සංකල්පනාවේ, දුර්වලතා මඟහරවා එලදායි නම්‍ය ආකල්පයක් ඔස්සේ සංකල්පීය ආදර්ශයක් ගොඩනඟා ගැනීම ඉන් පසුව පැමිණි ක්වන්ටම් චින්තාවේ අරමුණ විය. මේ අනුව එතෙක් නිව්ටෝනියානු චින්තාවන්ට අනුව හේතුඵල සම්බන්ධය පිළිබඳව පිළිගෙන පැවති ඒකෙක සම්බන්ධයේ ඇති දැඩි බව, අනම්‍ය බව, සීමිත බව දැඩිව ප්‍රතික්ෂේප විය. ක්වන්ටම් චින්තනයට අනුව, හේතුඵල සංකල්පයට නව අරුතක් හිමි විය. එනම්, "ඒකෙක සම්බන්ධයක අනම්‍ය බවකින් යුක්ත වූ අවශ්‍ය බව (ආවශ්‍යකතාව: necessity) වනාහී හේතුඵල සම්බන්ධය පිළිබඳ සංකල්පයේ අන්තර්ගත වේ," නමැති මතය ක්‍රමයෙන් පොදු පිළිගැනීමෙන් බැහැරවූ අතරම, ඒ වෙනුවට සම්භාවිතාමය බව (Probability) මූලික කරගත් අවශ්‍ය බවක් නොමැති, නිත්‍ය බවක් නොමැති ලක්ෂණයන්ගෙන් යුත් හේතුඵල සම්බන්ධයක් පිළිගෙන ඇත. ක්වන්ටම් භෞතිකවිද්‍යා චින්තනයේ මේ නවතම සම්භාවිතාමය

බව පිළිබඳ සංකල්පයේ වැදගත්කම වඩාත් පැහැදිලිව අන්තර්ගත වී ඇත්තේ වර්නන් හෛසෙන්බර්ග්ගේ අවිවේෂ්‍යතා මූලධර්මයේය (Principle of indiscernibles). මෙසේ සම්භාවිතාමය අදහස් මුල් කරගත් ක්වන්ටම් චින්තාව නිසාම හේතුඵල සංකල්පය සම්බන්ධව තිබූ හේතුව හා ඵලය යන දෙකෙහි අවශ්‍ය සම්බන්ධය පිළිබඳ අදහස ද ප්‍රතික්ෂේප වී ඇත.

හේතුඵලතාව පිළිබඳව ගොඩනැගුණා වූ මේ කතිකාවන්ට වඩා බෙහෙවින්ම වෙනස් භාවිතයක් පෙරදිග ලෝකයේ දාර්ශනික විමර්ශනයන් ඇසුරෙන් හමුවේ. ප්‍රාග් බෞද්ධ සහ බෞද්ධ යන තේමාවන් දෙකක් යටතේ වෙන් කළ හැකි මෙම විග්‍රහයන්හිදී හේතුඵල සුසමාදර්ශයට තර්කානුකූල වූත් දාර්ශනික වූත් වටිනාකමක් හිමිකර දී ඇත. විශේෂයෙන්ම ප්‍රාග් බෞද්ධ විග්‍රහයන් ඔස්සේ ඡායාමය හැඩගැස්මකට මග පාදා ගන්නා හේතුඵලතාව යන්න බුදු දහම් කතිකාවතේදී ඉතාමත් සුවිශේෂී ස්වරූපයකින් යුක්ත දාර්ශනික සංකල්පයක් බවට පත්ව ඇත. බුදු දහමෙහි කේන්ද්‍රීය දාර්ශනික සිද්ධාන්තය වන්නේ පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵලතාව යන්නයි . මජ්ඣිම නිකායෙහි සඳහන් වන පරිදි එය මෙසේය.

"හේතුඵලත්වයේ ස්වරූපය දන්නා දහම දකී.

දහම දකින්නා හේතුඵලත්වයේ ස්වරූපය දකී."

මෙසේ මෙතෙක් පෙර අපර දෙදිග ශාස්ත්‍රීය ගවේෂණයන්හි තර්ක විතර්ක හා අගය කිරීම්, ප්‍රතික්ෂේපයන් අතර දෝලනය වූ හේතුඵලතාව යන්නට තර්කානුකූල වූත් දාර්ශනික වූත් වටිනාකමක් හිමිකර දෙමින් බුදුදහම් කතිකාවතෙහි ඒ පිළිබඳව සුවිශේෂී විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. එම අව්‍යාජ භාවිතය පිළිබඳව පැහැදිලි කිරීමත්, එතෙක් මෙතෙක් ශාස්ත්‍රීය ගවේශනයන්හි හේතුඵල සුසමාදර්ශය පිළිබඳව ගොඩනැගුණා වූ නොයෙකුත් විග්‍රහයන් හඳුනාගෙන ඒ පිළිබඳව දාර්ශනිකව විමසා බැලීමත්, එම සියලු විග්‍රහයන් අතරින් හේතුඵලතාව යන්නට අව්‍යාජ වූත් දාර්ශනික වූත් භාවිතයක් ඇත්තේ කුමන කතිකාවක ද යන්න දාර්ශනික වශයෙන් විමසා බලා ගෙන හැර දැක්වීම මෙහිදී අපේක්ෂිතය.